# වේගිරිය නාථ දේවාලයේ ඓතිහාසික පසුබිම සහ පූජා චාරිත්‍ර

ආචාර්ය අජිත් තල්වත්ත

අවලෝකිතේශ්වර නාථ බෝධිසත්ත්ව වන්දනය ලොකේශ්වර නාථ ලෙස සංකල්පීය වෙනසකට බඳුන්ව නාථ දෙවියන් බවට පත්විය. කන්ද උඩරට රාජධානි අවධියේ සිට නාථ දේව වන්දනය මහනුවර ප්‍රදේශයේ ජනප්‍රිය දේව ඇදහීමක් බවට පත්ව තිබුණි. ඒ නිසා ම ප්‍රාදේශීය වශයෙන් ප්‍රධාන දේවාල ගණනාවක් ඉදි වී ඒ හා ආශ්‍රිත පුද පිළිවෙත් ගොඩනැගී ඇත. විශේෂයෙන් ම මහනුවර, වේගිරිය, පස්ගම හා දොඩම්වල යන නාථ දේවාල නාථ දේව වන්දනයේ ජනප්‍රියතම දේවාල වේ. මෙම අධ්‍යයනය ප්‍රධාන තේමා දෙකකින් සමන්විත ය. එනම් වේගිරිය දේවාලයේ ඓතිහාසික පසුබිම හඳුනාගෙන ඒ ආශ්‍රිතව පවතින පූජා චාරිත්‍ර පිළිබඳ විමර්ශනය කිරීමයි.

මහනුවර ප්‍රදේශයේ ප්‍රචලිත වූ නාථ දෙවියන් ඇදහීම වඩාත් ජනප්‍රිය වීමත් සමඟ උන්වහන්සේ උදෙසා ප්‍රදේශ ගණනාවක ම දේවාල ගොඩනැගුණි. එම දේවාල අතර ප්‍රධානතම දේවාල අතර වේගිරිය නාථ දේවාල වැදගත් විය. නාථ දේවාල පිළිබඳ අධ්‍යයනය කිරීමට පෙර දේවාලයෙහි මූලාරම්භය ගැන දැන ගැනීම වැදගත් වේ. මිනිසුන් තුළ දේව ඇදහිලි කිනම් වකවානුවක ඇති වූවා ද යන්න ස්ථිර ව ප්‍රකාශ කළ නොහැකි ය**(ගයිගර්,1946, 239-240).** එනමුත් තමන් අදහන දෙවියන් උදෙසා වැඳුම් පිදුම් කිරිම පිණිස යොදාගත් සුවිශේෂි ස්ථානය වන්නේ දේවාලය යි. දෙවියන් වැඩ වසන තැන දේවාලය වේ. ගුණසේන දෙමළ-සිංහල ශබ්ද කෝෂයෙහි දේවාලය ලෙස දෙවියන් වැඩ වසන තැන ලෙස හඳුන්වයි. එය (තේවදා-දේවතාවා) තේවලම්-දේවාලය, තේවාලයම්-දේවාලය අර්ථ දක්වා ඇත්තේ දෙමළ භාෂාවෙනි**(ගුණසේන දෙමළ-සිංහල ශබ්ද**

**කෝෂය,1965,996-999).** එය සිංහලයට පැමිණ ඇත්තේ දේවාලය යනුවෙනි. ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයෙහි දේවාලය ලෙස අර්ථ දක්වා ඇත්තේ දෙවියන් සඳහා ඉදිකරන ලද මැඳුර හෝ ගම් දෙවොලට අයත් ගම වශයෙනි **(ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය,1952,5611).** දේව යන්න ලතින් භාෂාවෙන් DEVS යනුවෙන් හැඳින්වෙන අතර එහි අර්ථය වන්නේ දීප්තිමත් යනුවෙනි**(සුනිල්,2001,61-65).** දෙවියන් පිළිබඳ විශ්වාසය මිනිස් සිතිවිලි අතරට පැමිණියේ කිනම් කලක ද දේවාල බිහිවීම ද එවන් අතීතයකට දිව යන බව විශ්වාස කළ හැකි ය.

නාථ දේවාල බෞද්ධ විහාරවලින් වෙන් ව ස්වාධීන ව පවතින බවට කදිම නිදසුනක් වන්නේ වේගිරිය නාථ දේවාලය යි. උඩුනුවර ගඟ පළාත වේගිරිය ගමේ කඳුගැටයක ගල්ලෙන් සමූහයක් ඇත. මෙයින් එක් ලෙනක එම දේවාලය ඉදි කර ඇත. උඩුනුවර පිහිටි වේගිරිය දේවාලය ලෝකේශ්වරනාථයන් වෙනුවෙන් ඉදිවූවක් බවත් එය 14 වැනි සියවසට අයත් බවත් එහි සෙල්ලිපියෙන් ප්‍රකට වේ **(RAS(CB),XVII,No.65,366).** බ්‍රාහ්මී අක්ෂරවලින් රචිත ලෙන් පූජා කිරීමේ සෙල්ලිපි පරීක්ෂා කළ හොත් ගම්පොල යුගයට වඩා ඈත ඉතිහාසයක් ඇති විහාරස්ථානයක් වශයෙන් මෙය හැඳින්විය හැකි ය**(පියනන්ද, 1997,40).** මෙහි ඇති ලිපි ප්‍රමාණය කෙටි වුවද, එයින් කියවෙන තොරතුරු අනුව මෙම දේවාලයේ පෞරාණිකත්වය කෙතරම් දැයි සිතිය හැකි ය. මෙම ලෙන්වල පුරාණයේ සිට ම භික්ෂු පිරිසක් බණ භාවනා කරමින් ජීවත් වන්නට ඇත**(සෝමානන්ද,1972,131).** මෙහි ඇති බ්‍රාහ්මී ලිපිවල අක්ෂර ස්වභාවය අනුව ක්‍රි.පූ.1 සහ 2 සියවස්වලට අයත් යයි නිගමනය කළ හැකි ය.

මෙම ස්ථානයට වේගිරිය යන නම යෙදීමට හේතු වූ කරුණු පරීක්ෂා කිරීමේ දී ඒ සම්බන්ධයෙන් ජනප්‍රවාද කිහිපයක් පවතී. මෙම කඳුගැටය අතරින් සමනොළ කන්දට වඩිනා භික්ෂූ පිරිසකට මෙම ස්ථානයේ දී බෙල්ල දක්වා වේයන් බැඳි දේව රූපයක් දක්නට ලැබුණු නිසා මේ ස්ථානය වේගිරිය නමින් හැඳින්වූ බව ජනප්‍රවාදයේ පවතී. දේවගිර ප්‍රතිරාජයා නමින් දේවගිරි, වේගිරි වී යැයි ද තවත් ජනප්‍රවාදයකි. එසේ ම ගම්පොල රාජධානියේ පාලකයෙකු ව සිටි සිවුවන බුවනෙකබාහු රජතුමා (ක්‍රි.ව.1341-1351) මේ දේවාලය අසලින් පැවති මාර්ගයෙහි අසුපිටින් ගමන් කරද්දී අසු සමඟ දේවාලය ඉදිරියේ ඇති ගල් තලය මත ඇද වැටී ඇත. කුමක් නිසා මෙය වී දැයි සෙවූ රජතුමා නුදුරු ගල්ලෙනක වූ දෙවිරුව දැක, එහි ගිරිය දක්වා වේයන් පස් බැඳ තිබූ නිසා වේගිරිය නම් වී යැයි එක් මතයකි **(එම).** මෙම ප්‍රවාද මගින් වේගිරිය නාමය කුමන අයුරින් සැකසෙන්නට මෙම ජනප්‍රවාද එකක් හෝ කිහිපයක් හේතු වන්නට ඇත.

වේගිරිය නාථ දේවාලය ගොඩ නගා ඇත්තේ කටාරම් කොටන ලද ගල්ලෙන අසුවන පරිදි ය. දේවාලය අභ්‍යන්තරය බැලීමේදී දක්නට ලැබෙන දේවරූප ඉතා වැදගත් වේ. අලංකාර කැටයම්වලින් පරිපූර්ණ දොර සහිත උළුවස්ස ඉතා පැරණි එකක් බව පෙනේ. එය නිල්ලඹ සිට ගඟේ පාවී ආ එකක් බවට ජනප්‍රවාදයක් පවතී. එහි උස අඩි 6 ක් හා අඟල් 3 කි. පළල අඩි හතරකි. ප්‍රධාන කණු දෙකේ පහළ කෙළවර වූ කොටුවේ නිමවා ඇති සිංහයා ඇතුළු පැත්තට හැරී ඇති නමුත් ඉදිරියට මුහුණ හරවාගෙන සිටී. මෙහි කණු දෙකේම කැටයම් ඇත. දේවාලය ඉදිරිපස ඇති ආලින්දය දැව කණු මත පිහිටා ඇති අතර, එහි ඉහළ දක්නට ඇති පේකඩ මහනුවර මඟුල් මඩුවේ ඇති පේකඩවලට සමාන ලක්ෂණ පෙන්වයි. පෞරාණික ලාංකික ශිල්පීන්ගේ නිර්මාණයක් වූ සඳකඩ පහණ් දෙකක් ද මෙහිදී ප්‍රධාන දොරටුව ඉදිරිපස දක්නට ඇත. ප්‍රධාන සඳකඩ පහණ දිග අඩි 4 ද පළල අඩි 3 අඟල් තුනකි. මෙහි අර්ධ වෘත්තයේ බාහිර තීරුවේ සත්ත්ව රූප කිහිපයකි. දෙපස තලයන්හි ඇත් සහ හංස රූප තිබේ. අනතුරුව භාවනා විලාශී අශ්ව, සිංහ රූප සටහන් කැටයම් ඇත. සිංහ රූප දෙකට මධ්‍යයේ දක්නට ඇති සංකීර්ණ කැටයම මිනිස් රූපය හැඩය ගන්නා රූප සටහන් සහ මල් පොකුරක් ඇත. වේගිරිය දේවාලයේ ඇති අනෙක් සඳකඩ පහණ දිගින් අඩි 3 අඟල් 2ක් ද පළල අඩි 2 අඟල් 7කි. මෙහි පද්මයක් ඇත. කැටයම් රහිත ය. එම දොරටුවේ පැරණි කැටයමින් සරසන ලද ගල් උළුවස්සකි. මේ හැර මෙම දේවාලයට අතිරේක එක් පසෙක දක්නට ලැබෙන්නේ කුඩා දාගැබක් හා ප්‍රතිමා ගෘහයකි. එය ප්‍රමාණයෙන් කුඩා වුව ද විසිතුරු කලාත්මක හැඩරුවකින් නිමවා ඇත. මෙම දේවාලය අබියස පත්තිනි දේවාලය, වාහල්කඩ, මුළුතැන්ගෙය, මුර ගෙය හා පත්තිරිප්පුව ආදි වශයෙන් හඳුන්වා දිය හැකි ගොඩනැගිලි රැසකි.

දේවාලය ඉදිරිපස ද ගල්තලාවේ ඇති ශිලා ඉතා වැදගත් වේ. මෙම ලිපිය දිගින් අඩි 6ක් හා පළලින් 4කුත් අගල් 9කින් යුක්ත ය. එහි ව්‍යවහාරික වර්ෂය ලෙස ශක වර්ෂ 1337 හෙවත් ක්‍රි.ව 1415 යනුවෙන් සඳහන් වේ. මෙම ලිපියෙහි ලෝකේශ්වර නාථයන් වහන්සේට කළා වූ පූජාවක් ගැන සඳහන් ය. එහි හතරවන බුවනෙකබාහුගේ 10 වර්ෂය හා තුන්වන වික්‍රමබාහුගේ 36 වෙනි වර්ෂය ද සඳහන් වේ. හතරවන බුවනෙකබාහු සහ පස්වන බුවනෙකබාහු යන රජවරුන් කොපමණ කලක් රජ කළා ද යන්න ඉතිහාසයේ හෝ සමකාලීන වෙනත් ලේඛනයක සඳහන් ව නැති හෙයින් ගම්පොල යුගයේ ඉතිහාසය සකස් කිරීමෙහි ලා මෙම ලිපිය ඉතා වැදගත් වේ **(Mudiyanse,1976, 45)**. මෙම ලිපියේ තොරතුරු මගින් වේගිරිය දේවාලයට ප්‍රදානය කරන ලද ඉඩකඩම් පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි ය. මේ ආකාරයෙන් බලන විට වේගිරිය නාථ දේවාලය

ගම්පොල යුගයට අයත් වූවකි. මෙම දේවාලය ඇසුරෙන් කිසිදු කැණීමක් මෙතෙක් සිදුකර නොමැත.

වේගිරිය දේවාලයන්හි අවලෝකිතේශ්වරගේ බිරිඳ වශයෙන් සැලකෙන තාරා බිසව සඳහා විශේෂ ස්ථානයක් හිමි වේ. දෙවඟනක් ලෙස තාරා බිසව මෙම ප්‍රදේශවල ජනතාවගේ නොමඳ ගෞරවාදරයට පත්ව ඇත. ප්‍රධාන වශයෙන් වේගිරිය දේවාලයේ තාරා වන්දනයට සමගාමීව පත්තිනි දෙවියන් උදෙසා වෙන් වූ දේවාලයක් ද ඇත. වේගිරිය නාථ දේවාලයට ඉදිරියෙන් ඇති පත්තිනි දේවාලය ගම්පොල යුගයේ දී නිර්මාණය කරන ලද ගොඩනැගිල්ලකි. පළලින් අඩි 6ක් සහ දිගින් අඩි 10ක් පමණ වේ. මෙහි බිත්ති වරිච්චි මැටියෙන් සාදා ඇත. නාථ දෙවියන් උදෙසා කැප වූ පුද බිමක් තුළ පත්තිනි දේවාලයක් ඉදි කර ඇත්තේ කවර අරමුණකින් ද යන්න සොයා බලා පහැදිලි කර ගැනීම අවශ්‍ය වේ. සිංහල බෞද්ධයන් පුද පූජා පැවැත්වීමේදී භාරතීය ප්‍රභවයක් ඇති දෙවිවරුන් අතර ප්‍රධාන තැනක් පත්තිනි දෙවියන්ට හිමි වේ **(ධර්මදාස සහ තුන්දෙණිය,1994,283).** සාම්ප්‍රදායික මතයට අනුව ඇය ශිව දෙවියන්ගේ භාර්යාව වන පාර්වතියගේ අවතාරයක් වන්නී ය**(අමරසේකර,2007,17).** එහෙත් සිංහල සම්ප්‍රදායට අනුව ඇය බෝධිසත්ත්ව පාරමිතාව පුරන්නියකි. පත්තිනි දේවිය ආදරය, ඉවසීම හා සමාව දීම ආදී ගුණ දහමින් හෙබි භාර්යාවක ලෙස සලකනු ලැබේ**(ධර්මදාස සහ තුන්දෙනිය,1994,281-283).** පත්තිනි යන්නෙහි අර්ථය ස්වාමි භක්තිය ඇති බිරිඳ යන්නයි. මහාචාර්ය දයා අමරසේකරට අනුව පත්තිනි දේවිය මගින් සංකේවත් කරන්නේ සශ්‍රීකත්වය හා නිරෝගී භාවය යි. ඇය මගින් පවිත්‍රතාවය සහ මාතෘත්වය වැනි ලක්ෂණ ද නිරූපණය කර යි.

වේගිරිය දේවාල පරිශ්‍රය තුළ පත්තිනි දේවාලයක් ඉදි කිරීමෙන් බලාපොරොත්තු වූයේ කුමක් ද යන්න පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම වැදගත් වේ. මෙම භූමියේ ද වැඩ සිටින නාථ දෙවි මිනිසුන්ට සෙත සලසමින් රෝග සුව කරමින් මිනිසුන්ගේ පරලොව ජීවිතයට අවශ්‍ය මඟපෙන්වීම් ලබා දේ. සරම්ප, පැපොල, වසූරිය වැනි රෝග පත්තිනි දෙවියන්ගේ ආරක්ෂාවෙන් සුව වන බවට සිංහලයෝ සලකති. මෙම ලෙඩට අමතර ව වෙනත් රෝග අවස්ථාවලදී ද කිරි අම්මලාට දානය සඳහා බාරහාර වීම සිංහල සිරිතයි. ප්‍රදේශවාසීන් මෙම දේවාලයට ද පැමිණ දරුවන් හට නිතර නිතර රෝග පීඩා ඇති වූ කළ පත්තිනි දේවාලයට රැගෙන ගොස් දෙවියන්ට භාර කරති. එමගින් ඔවුන්ගේ සුවසෙත අපේක්ෂා කරති. ගැබ්බර මව්වරු ද දරු ප්‍රසූතියට ආසන්න කාලයේදී දෙවියන්ගෙන් පිහිට

පතා පඬුරු වෙන් කරති. එක් පසෙකින් මෙම දේවාලයේ නාථ දෙවියන් වැඩ සිටිමත් තවත් පසෙක තාරා දෙවඟන හා පත්තිනි දෙවඟන වැඩ සිටීමත් තුළ මිනිසුන්ට උද්ගත වන රෝග, අමනුෂ්‍ය බිය යනාදිය දුරු කර ජනතාවට සෙත සලසන පුදබිමක් ලෙස සැලකිය හැකි ය.

වේගිරිය නාථ දේවාලේ පවත්වන චාරිත්‍ර පිළිවෙත් ද සම්බන්ධයෙන් මින් අනතරුව සාකච්ඡා කළ යුතුය. එම පිළිවෙත් අධ්‍යයනයේදී උපයෝගී කරගනු ලබන පර්යේෂණ ක්‍රමයක් වන්නේ පූජා චාරිත්‍ර සිදුකරන ආකාරය නිරීක්ෂණය කිරීමයි. එම පූජා චාරිත්‍ර පවත්වනු ලබන අදාළ පාර්ශවයන්ගේ අදහස් මෙහිදී විමසා එහි පරමාර්ථ සාකච්ඡාවට බඳුන් කෙරේ. වේගිරිය නාථ දෙවියන් උදෙසා වූ පූජා චාරිත්‍ර පැවැත්වීමේ දී අතීත සහ වර්තමාන තත්ත්වය අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ. මෙම දේවාල තුළ අතීත පිළිවෙත් අවබෝධ කරගැනීමට වර්තමාන චාරිත්‍ර ගුරු කොට ගැනීම අත්‍යාවශ්‍ය වේ. දෙවියන් උදෙසා පවත්වන භක්ති පූර්වක පූජා ක්‍රම හා චාරිත්‍ර විධි තුළ කාලය හා වේලාවන් සම්බන්ධ කොට සලකන විට ඒවා වෘත්තාකාර පිළිවෙළ රටාවක් අනුව සිදු කෙරෙන බව හෙළි වේ. මේ අනුව වර්ෂයක් තුළ සිදුවන චාරිත්‍ර හා පූජා ක්‍රම දෛනික, සතිපතා හා වාර්ෂික වශයෙන් පවත්වනු ලබයි. මෙයින් දෛනික පූජා හා චාරිත්‍ර හැරුණු විට සතිපතා හා වාර්ෂික ක්‍රියා දාමයෙහි දවස්, නැකැත්, මූර්ත, ග්‍රහචක්‍ර හා ඍතුචක්‍ර යන ජ්‍යොතිෂ සාධක ද අභ්‍යන්තර හා බාහිර වශයෙන් ද බෙදා වෙන් කරනු ලබයි. මෙම බෙදීම තුළ ඇත්තේ දේවාලයේ ගර්භ ගෘහය හෙවත් වැඩ සිටින මාළිගාව හා ඉන් පිටත යන අදහස ය. දේවාලයේ ගර්භ ගෘහය වෙත පිවිසිය හැක්කේ කපුරාළ මහතුන්ට පමණි. දෛනික දේවාලයේ රාජකාරිවල නිරත වන ඇතුළත කට්ටලයේ නිලකාරයන් හට ද ගර්භ ගෘහය තුළට ප්‍රවේශවීමට අවසර නොලැබේ. දෛනික තේවා කටයුතු හා වාර්ෂික නානුමුර මංගල්‍යයේ චාරිත්‍ර සිදුකරනු ලබන්නේ ගර්භ ගෘහය තුළ වන අතර මෙම අවස්ථාව නැරඹීමට බාහිර පුද්ගලයන්ට අවසර නැත. බාහිර පුද්ගලයන් උදෙසා කෙරෙන පූජා හා යාතිකාවන් ගර්භ ගෘහයෙන් පිටත සිදු කරනු ලබයි. පිළිවෙත් අනුගමනය කරන්නේ දේවාලය තුළ පවත්නා පාරිශුද්ධිය පිළිබඳ අනුගමනය කරන චර්යා ධර්මයන් මූලික කොට ගෙන බව වැඩිදුරටත් විමසීමෙන් පෙනී යනු ඇත.

දේවාලය තුළ අවධානය යොමු කරන ප්‍රධාන අංගය වන්නේ පාරිශුද්ධිය යි. නාථ දේවාල චාරිත්‍ර, පූජා ද්‍රව්‍යය, පුද්ගලයන්, දේවාල භූමිය හා දේවාලය පිහිටි ගම වශයෙනුත් මෙම කරුණු සැලකිල්ලට ගනු ලැබේ. දේවාලය පිරිසිදුව තබා ගැනීමට කහ දියර ඉසීම

හෝ කොහොඹ අතු එල්ලා තැබීම අතීතයේ සිට සිදු කර ඇත. තේවාකරුවන් හිස තලප්පාවක් බැඳීමේ අරමුණ හිසකෙස් වැටී අපවිත්‍ර වීමෙන් වැළැක්වීම ය. මුරුතැන් රාළ මුරුතැන් පිසීමේදී කතා බහ නොකර සිටීම, මුඛවාඩමක් බැඳීම සහ දිනපතා ස්නානය කිරීමත් පරිශුද්ධත්වය උදෙසා පවත්වනු ලබන චර්යා ධර්මයන් ය. මුරුතැන් පූජාවට අළු වර්ග හෝ බොඩ වර්ග ආශ්‍රිත වළවළු භාවිතයට නොගන්නේ ද මෙම හේතුව නිසා ය. සැම විටම මුරුතැන් පිළියෙල වන්නේ දේවාලයට අයත් මුළුතැන්ගේ තුළ වීම ද විශේෂිත ය. තේවා කටයුතු සඳහා සහභාගී වන පිරිස දැඩි සේ පරිස්සම් වන්නේ කිලිවලට හසු නොවී සිටීමට ය. මළ කිල්ලට හසු වූ අයෙකු තුන් මසක් යන තුරු තේවා කටයුතුවලින් ඈත් වී සිටිය යුතු බවට පිළිගත් විශ්වාසයකි. තේවා කටයුතු භාර ප්‍රධාන කපුමහතා යම් අයෙකු මිය ගිය හොත් ඒ සඳහා සහභාගී වීමට පවතින අවකාශ ඉතා අඩු ය. දෙවියන් උදෙසා කැපවී සිටිය ද ගමේ මෙවැනි කටයුතු සඳහා සහභාගී නොවීමෙන් සමාජමය වශයෙන් යම් ගැටලු රැසකට මුහුණපාන බවට ඔවුන්ගේ මතය වේ. මළ කිල්ල හැරුණු විට වැදුම් කිල්ල, කොටහළු කිල්ල, ස්ත්‍රීන්ගේ මාසික ශුද්ධිය, මෛථුන්‍යය යනාදිය කිලි වශයෙන් සැලකේ. තවද කිලිවලට හසු වී දේවාලවල කටයුතු කිරිම දඬුවම් ලැබිය හැකි වරදකි. එසේ වුවහොත් මිය යාමට පෙර දුක්විඳ මියයන බව සහ වස් දොස් වැදීමට හේතුවක් බවත් තේවාකරුවන්ගේ මතය වේ. අදට ද මේවා වෙනස් නොවී පවතී. අපිරිසිදුව පැමිණීම නිසා යම් අනර්ථයක් සිදුවන බවට බොහෝ දෙනා පිළිගනිති. එහෙත් සමාජය නවීකරණය වීමත් සමඟ මෙවැනි විශ්වාස නොපිළි ගන්නා සමාජයක් ද ගොඩනැගී ඇත.

දේවාල ආශ්‍රිතව ඉටු කරන චාරිත්‍රවල ප්‍රධාන අරමුණ වන්නේ දෙවියන් සතුටු කිරීම යි. එලෙස දෙවියන් සතුටු කිරීමෙන් දෙවියන්ගේ පිහිට සහ අරක්ෂාව ලබාගත හැකි බවට දැඩි විශ්වාසයක් සමාජයේ පවතී. මේ නිසා දෙවියන් උදෙසා පවත්වන පූජා චාරිත්‍ර ඉතාමත් උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට දේවාල චාරිත්‍ර ඉටුකරන පිරිස උත්සාහ ගත්හ. ඉහත නාථ දේවාල පිටත සේම ඇතුළත ද පූජා සංවිධානයේ දී පිරිසිදු භාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන බවට තේවා කටයුතු භාර ප්‍රධාන කපුමහතා පෙන්වා දෙති. පිරිසිදු බව හෙවත් පාරිශුද්ධිය යන්නට විවිධ අර්ථයන් ගැබ් වූවද නාථ සංකල්පය තුළ පාරිශුද්ධිය ලෙස හඳුන්වන්නේ පිරිසිදු බව යි. එහිදී ශාරීරික පාරිශුද්ධිය හෝ බාහිර වශයෙන් ඇඳුම් පැළඳුම්වල පිරිසිදු බව අදහස් නොවේ. සාම්ප්‍රදායික සිංහල සමාජය තුළ පාරිශුද්ධ බලය ඇත්තේ "කිල්ල" නමැති සංකල්පය තුළ යි **(හෝල්ට්, 1994,206).** ආචාර්ය ජෝන් ක්ලිෆර්ඩ් හෝල්ට් පවසන්නේ පිරිසිදු බව උපයෝගි කරගෙන ඇත්තේ දෙවියන් හා

දේවාලවල බලය ආරක්ෂා කරගැනීමට බව පවසයි **(එම).** එමගින් දෙවියන් කෙරෙහි භක්තිය අනිවාර්යයෙන් රැකෙන බව ඔහු තවදුරටත් පෙන්වා දෙයි. මෙම පසුබිම නාථ දේවාල ඇසුරෙන් පමණක් නොව සෙසු දේවාල තුළ ද දක්නට ඇත. බිය වැද්දවීම මගින් භක්තිවන්ත බව ආරක්ෂා වන දෙයකි. එය නොමැති වුවහොත් දෙවොල සහ බැතිමතා අනිවාර්යයෙන් ම දුරස් වීමට පුළුවන. දෙවියන්ට එරෙහිව ගියහොත් තමන්ට අවැඩක් වේ යන විශ්වාසය මිනිසුන් තුළ ඇත.

මේ අයුරින් පූජා විධි හා පාරිශුද්ධිය මගින් සිදුව ඇති වැදගත් ම මෙහෙය වන්නේ දේවාලයේ පූජා විධි ක්‍රමවත්ව පැවැත්වීමට හැකි වීමයි. පූජා චාරිත්‍ර පැවැත්වීමේ දී විවිධ කුල උපයෝගී කරගෙන ඇති අතර එය පූජා චාරිත්‍රයන්ගේ පිරිසිදු බවට බලපෑම් කළ බවක් නොපෙනේ. මධ්‍යකාලීන යුගයේ කුලය සහ වෘත්තිය අතර තිබූ අන්‍යෝන්‍ය ගැළපීම හේතුකොට ගෙන දේවාලයට සේවා සැලසූවන්ගෙන් සමාජයේ එදා පැවති සෑම කුලයක්ම පාහේ නියෝජනය වී ඇති බව පැහැදිලිව පෙනී යනු ඇත **(පීරිස්, 1963, 183-193).** දේවාලේ ප්‍රධාන භාරකාරීත්වය දරමින් සියලු නිලකාරයන් මෙහෙය වූයේ බස්නායක නිලමේවරයාට පැවරෙන අතර ඔහු නියෝජනය කළේ ගොවිගම කුලය යි. ඇතුළ් කට්ටලේ සහ පිට කට්ටලේ නිල පංගු බාරව ක්‍රියා කළේ ගොවි කුලයට අයත් වූවන් ය. මෙම නාථ දේවාලවල එම රාජකාරිය අතීතයේදී සිදු කර ඇත්තේ ගොවිගම කුලයට අයත් පිරිස වුවත් අද වන විට එම තත්ත්වය වෙනස් වී තිබේ. මීට අමතරව සෙසු කුල නියෝජනයක් ද දේවාල රාජකාරි සමඟ බද්ධ වේ. එනම් නවන්දන්නා කුලය (රන් රිදී වැඩ), බඩහැල කුලය (පාවඩ එළීම, පිරුවට සැපයීම, රෙදි සේදීම), බෙරවා කුලය (තූර්ය වාදනය සහ නැටීම), කින්නර කුලය (පැදුරු කළාල, කිරි ගොටු, වට්ටි සැපයීම), හුණු කුලය (හුනු සැපයීම සහ හුනු ගෑම), පදු සහ දුරාවේ කුලය (පන්දම් ඇල්ලීම, පල්ලැක්කි ගෙනයෑම හා කත් ඇදීම), හකුරු කුලය (හකුරු සැපයීම, පැණි සැපයීම), පන්න කුලය (අලි ඇතුන්ට කොළ සැපයීම), සහ රොඩී කුලය (ලණු සැපයීම සහ හම් සැපයීම) විසින් ද පවත්වාගෙන යනු ලැබිය. ප්‍රධාන නාථ දේවාල ඇසුරෙන් චාරිත්‍ර පැවැත්වීමේ දී ඒ සඳහා නියමිත වූ කාර්ය මණ්ඩලයක් සිටීම ද අනිවාර්ය වේ. මේ සඳහා නිල වශයෙන් අතීතයේ සිට නාථ දේවාලය සතු ඉඩම් පරිහරණය කරන සමාජයක් සැකසී ඇත.

නාථ දෙවියන් උදෙසා පූජා චාරිත්‍ර ඉටුකරනු ලබන ප්‍රකට දේවාලයක් ලෙස චාරිත්‍ර ඉටුකිරීම පිණිස ප්‍රමුඛ ව කටයුතු කරන පවුල් දෙකක් සිටී. දේවාලයේ භාරකරු වශයෙන් පත්වන බස්නායක නිලමේවරයාගේ මගපෙන්වීම තුළ ඔවුහු කටයුතු සිදුකරති.

එම පවුල් දෙක ලෙස වේගිරියේ වීදියේ කපුගෙදර සහ උඩහවිහාර වත්තේ කපුගෙදර පිරිස් සඳහන් කළ හැකි ය. තවද වේගිරිය දේවාලයේ හා බැඳුණු රාජකාරී ඉටු කිරීම පිණිස ඒ ඒ කුල හා සම්බන්ධ පංගු දහ නමයකට අයත් පිරිස් දායක වීම කැපී පෙනේ. එය මහනුවර ලේඛනාරක්ෂක දෙපාර්මේන්තුවේ ඇති ප්‍රවේණි ලේඛනයේ ද සඳහන් වේ. සියලුදෙනාගේ සහයෝගයන් තුළ නාථ දෙවියන් වෙනුවෙන් ඉටු කරන පූජා චාරිත්‍ර හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. මෙම නාථ දේවාලවල පූජා චාරිත්‍ර ලෙස නානුමුර මංගල්‍යය, අලුත් සහල් මංගල්‍යය, පෙරහැර මංගල්‍යය, සහ කාර්තික මංගල්‍යය යනාදිය ඉටු කරයි.

මෙම දේවාලයේ පෙරහැර මංගල්‍යය අවසන් වීමත් සමඟ ඉදිරි රාජකාරී වර්ෂය ආරම්භ වේ. මේ නිසා ම ඒ ඒ රාජකාරී භාර අයට බස්නායකවරයාගේ අත්සනින් යුතු නොතීසි මගින් රාජකාරි පැවරීම හෙවත් දැනුම්දීම කරනු ලබයි. ඒ අනුව නව වර්ෂයේ රාජකාරී අරඹන අයට පැවරෙන ප්‍රථම කාර්යය වනුයේ සතියකට වරක් මුළුතැන් බෑමේ රාජකාරිය කිරීමයි**(2013-07-08 දින පැවැති සාකච්ඡාව).** මේ දේවාලය් සතියකට වරක් බදාදා හෝ සෙනසුරාදා මුල්තැන් පමණක් සිදුකිරීම අනිවාර්ය වේ. මුල්තැන් සඳහා දිනකට වී භාගයක් (කිලෝ 10) හා පොල්ගෙඩි 2ක් දේවාලයේ ඉඩම්වලින් ලැබෙන වී හා පොල්වලින් දෙනු ලැබේ. සමහර දිනවලට මුල්තැන් පූජා කිරීමේ කටයුත්ත භාර හාර වශයෙන් හෝ දෙවියන් කෙරේ ඇති ගෞරවය නිසා කිරීමට බාරගත් හෝ බැතිමතුන් අවශ්‍ය බරපැණ දරා උත්කර්ෂවත් අයුරින් එම කාර්ය කිරීමට දායකවීම ද කැපී පෙනේ.

කාර්තික මංගල්‍යය පවත්වන්නේ හින්දු දින දර්ශනයට අනුව නොවැම්බර් මස පසළොස්වක පෝය යෙදෙන චන්ද්‍ර මාසයේදී ය**(වාචිස්වර,1960,113).** දළදා මාළිගාව ඇතුළු සිවු දේවාල සහ පිටිසර නාථ දේවාල එක්ව මහනුවර යුගයේ පටන් පවත්වාගෙන එනු ලබන මෙම මංගල්‍යයේ ප්‍රධාන චාරිත්‍රය වන්නේ ශුභ නැකතින් පහන් දැල්වීමයි. දෙවන රාජසිංහ රජුගේ කාලයෙහි ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවැත්වූ මෙම උත්සවය රොබට් නොක්ස්ගේ කෘතියේ ද අඩංගු වී ඇත **(An Historical Relation of the Island of Ceylon ,1994,103).** හින්දූන් විසින් දීපාවලී ලෙස සමරන්නේ ද මෙම උත්සවයයි. පැරණි ඉන්දියාවේ කාර්තික පූර්ණමාසී යන නමින් හැඳින්වූ මෙම උත්සවය මගින් ත්‍රිපුරාසුර නම් අසුරයා පරදවා ශිව දෙවියන් ලද විජයග්‍රහණය සමරනු ලැබේ. මෙම උත්සවය මගින් සිදු කරන්නේ දෙවියන්ට ආලෝකය ලබාදීම බවට ඩබ්.ජී. මුතුබණ්ඩා කපුමහතා විසින් ප්‍රකාශ කරන ලදී. අතීතයේ දී රාජකීය ගබඩාවලින් තෙල් නාථ දේවාලවලට ගෙනවුත් එහිදී තෙල් බෙදා දීම සිදු කෙරිණි. වර්තමානයේදී එම තෙල් බෙදා

දීම සිදු කරනු ලබන්නේ නාථ දේවාලයේ ය. රෝග නිවාරණයෙහි නාථ දෙවියන් සතු සුවිශේෂී බලයක් ඇතැයි යන විශ්වාසය සහ මහනුවර රජවරුන්ගේ රාජ්‍යත්වය සඳහා දිව්‍යමය උරුමයක් නාථ දෙවියන්ගෙන් ලැබුණු බවට තිබූ පිළිගැනීම නිසා රාජ්‍යයේ කේන්ද්‍රස්ථානයක් වශයෙන් නාථ දේවාලය අද්විතීය වැදගත්කමක් හිමිකර ගැනීම මීට හේතු බව ආචාර්ය ජෝන් හෝල්ට්ගේ අදහස වේ**(හෝල්ට්, 1994, 178).**

වේගිරිය නාථ දේවාලයේ ද වැඩ සිටින දෙවියන් උදෙසා කාර්තික මංගල්‍යයක් පවත්වනු ලැබේ. ඉල් පුර පසළොස්වක ළං වෙත්ම මහනුවර මාළිගාවෙන් දියවඩන නිලමේ දැනුම් දීමට අනුව මහනුවර නාථ දේවාලයේ දී ඒ ඒ සිද්ධස්ථානවලට කාර්තික මංගල්‍යයට අවශය තෙල් ලබාදෙයි. නමුත් මුල් වකවානුවේදී තෙල් ලබාගැනීම පිණිස දේවාලයෙන් කිසිවකු ගොස් නැති වුවත් වර්තමානයේ එම කාර්ය සඳහා එම වර්ෂයේ රාජකාරී භාර කපුමහතා ගොස් තෙල් ලබාගනී. මෙම දේවාලයට තෙල් නැළියක් ලබාදේ. ලබාගත් තෙල් ද රැගෙන යළි දේවාලයට පැමිණ දළදා මාළිගාවෙන් ලබාදෙන සුබ දිනයේ දී එනම් ඉල් පුර පසළොස්වක පොහෝ දින සවස දේවාලයේ ආලෝක පූජා පවත්වා පහන් දැල්වීම සිදු කෙරේ. කාර්තික මංගල්‍යය සිදුකිරීමේ දී හැන්දෑදුරය ගසා රාජකාරී කටයුතු අවසන් කරනු ලැබේ.

නාථ දේවාලය තුළ වසර ආරම්භයේදී ඉටු කරනු ලබන පූජා චාරිත්‍ර අතර අලුත් සහල් මංගල්‍යය ද ප්‍රමුඛ වේ. කුඹුරුබිම් තැනීමේ පටන් අස්වනු ගෙට ගැනීම තෙක් කටයුතු බුදුන් සහ දෙවියන් ඇදහීමෙන් සිදුකිරීම සම්ප්‍රදායානුකූලව කිරීම ගොවි සිරිත ය. ගොයමට වන හානි වළක්වා ගැනීමට දේවාල කරා ගොස් පුවක් මල්, නා අතු වැනි දෑ යාතිකා කරවා කුඹුරුවල එල්වා තැබීම ගොයම් පූදින කාලය තුළ ගොවීන් අනුගමනය කරනු ලබන චාරිත්‍රයකි. මෙසේ නෙළාගත් අස්වැන්නේ අග්‍රශෂ්‍ය කොටස දෙවියන්ට, බුදුන්ට, පූජා කෙරේ. අගසස් පූජා අලුත් සහල් මංගල්‍යය වශයෙන් මෙම චාරිත්‍ර මාලාවට අයත් වේ. මෙය දිවයින පුරා සිදුකරනු ලබයි. නවම් මස මාළිගාවෙන් දැනුම් දීමට අනුව දේවාලයේ මුළුතැන්ගේ රාජකාරී භාර මුළුතැන්ගේ රාළ විසින් පල්ලේකැලේ වී අටුව ඇති ස්ථානයට යනු ලැබේ. නමුත් අතීතයේදී නම් පැමිණ ඇත්තේ ගුරුදෙණියට ය. වේගිරියේ දේවාලයේ නම අඬගසන විට හේමකඳ රැගෙන ගොස් සිටින මුළුතැන්ගේ රාළට වී නැළියක් සහ සහල් නැළියක් ලබා දෙයි. එසේ ලබාගත් අලුත් සහල් දේවාලයට නුදුරු ස්ථානයක තබා මාළිගාවෙන් ලබාදුන් නැකත් දිනයේ දී ගෞරව සම්ප්‍රයුක්ත ව දේවාලය දක්වා වැඩමවාගෙන විත් නියමිත වේලාවට අලුත් සහල් මංගල්‍යය වෙනුවෙන් මුල්තැන්

බැම කරනු ලැබීමක් දැකිය හැකි ය. මුළුතැන් පූජාවේ ද අළු නොවන ව්‍යංජන වර්ග භාවිත කරන අතර මුළුතැන් පිදීමේ දී ගමන් හේවිසියෙන් රැගෙන ගොස් පූජා කෙරේ. අලුත් සහල් පුදා දෙවියන් සතුටු කිරීම අදාළ තේවා කටයුතු භාර කපු මහතාගේ වගකීම වේ. උදාවන සිංහල අලුත් අවුරුද්ද පාදක කරගෙන පවත්වන අලුත් අවුරුදු මංගල්‍යය ද වේගිරිය දේවාලය මඟින් පවත්වනු ලැබේ. සිංහල, හින්දු, අවුරුද්දට හිසතෙල් ගාන නැකැත් වේලාවට නානුමුර මංගල්‍යය ද පැවැත්වේ. නානුමුර මංගල්‍යය අවුරුද මංගල්‍යය ලෙස ද හඳුන්වයි. එම කාර්ය නිමකර දේවාලයේ රාජකාරී භාරව කටයුතු කරන පිරිස බස්නායකවරයා හමුවීමට යාම ද අනිවාර්ය චාරිත්‍රයකි. එම ගමනේදී ගම්වසම් පංගුව හා කපුපංගුව රාජකාරී ඉටු කරන පිරිස විසින් කැවිලි පෙට්ටිටක් රැගෙන යා යුතුය.

වසර පුරා පවත්වන මංගල්‍යය අතරින් ඉතා වැදගත් මංගල්‍යය වන්නේ පෙරහැර පැවැත්වීමයි. මහනුවර දළදා මාළිගාවෙන් කරනු ලබන දැනුම් දීම් පරිදි මහනුවර දේවාලවල කප් සිටුවන ඇසළ අවපසළොස්වක හෙවත් මාසේ පොහොය දින සකස් කර ගන්නා කප නිකිනි පුර පැලවියදා පාන්දර නැකතට සිටුවිය යුතුය. එකී නැකතට වේගිරිය දේවාලයේ එම කාර්යය කරනු ලැබේ. මේ සඳහා ඵල නොදැරූ, කඳෙහි වට ප්‍රමාණය තෙවියනක් පමණැති, ළපටි කොස් ගසක් තොරාගනු ලැබේ. ගස අවට බිම පිරිසිදු කර දුම්මල අනුවාසනය කර පිළියෙල කළ සඳුන් දියර ඉස ගස කැප කිරීමට කපුරාළලා ක්‍රියා කරති. වැටි නවයකින් යුත් දල්වන ලද පහනක් ගස මුල තබා බුලත් නවයක් සහ මල් වර්ග නවයක් තබා එය ද පූජා කරයි**(එම)**. එම වෘක්ෂයට අධිපති දෙවියෙකු සිටී නම් ඉන් වඩින ලෙසට ද කන්නලව් කිරීමත් සිදු කරන බවට කපු මහතා සඳහන් කළේ ය. සෙසු දේවාල අසුරෙන් ද මේ අකාරයෙන් කප් සිටුවීමක් සිදු කරයි. පංචතූර්ය නාද මාධ්‍යයේ එම ලී කොට නියමිත දේවාල වෙත මහත් ගෞරවයෙන් රැගෙන යයි. බිමෙහි නියමිත ස්ථානයේ එකී කොටස සිටුවනු ඇත**(එම,31)**. උඩින් පියස්සක් තනා හාත්පස සුදු රෙදිවලින් අසුරා අවට ගොක් කොළ ඇද මල් පළතුරු ආදිය එල්ලවා අලංකාර කෙරේ. කප සිටුවීමෙන් ඉටු කරන්නේ පොරොන්දුවකි. එනම්, නිශ්චිත කාලසීමාවක් තුළ පෙරහැර රාජකාරී අවසන් කරන බවකි. කප් සිටුවීමට කොස් ගස තෝරාගැනීමෙන් අපේක්ෂා කරන බලාපොරොත්තු රැසකි. කොස් ගස අධික කිරි ගසක් වන නිසාත්, විශාල ගෙඩි හටගන්නා වෘක්ෂයත් නිසාත්, සමෘද්ධිය හා සෞභාග්‍යය සංකේතවත් වන ගසක් ලෙස පිළිගෙන තිබේ(¨ැබැඩසර්එයබ්ල 1978ල72*.පවිත්‍රත්වය පිළිබඳ ආකල්පයකින් නොඉඳුල් ගසක් යොදා ගැනේ. මේ සඳහා පිරිමි කොස් ගසක් තෝරාගන්නා බව එච්.එල්. සෙනෙවිරත්න කප සඳහා යොදා ගැනෙන කොස් ගසින් පුරුෂ ලිංගයත් කිරිවලින් ශුක්‍රත් සංකේතවත්

කරන බව පවසයි(ෂඉසා).

මෙසේ කප් සිටුවා මසකට පසු හෙවත් බිනර පුර පැලවියදා පෙරහැර ආරම්භ කෙරේ. මෙම දිනය විශේෂ හේතු නිසා බොහෝ දුරට වෙනස් වෙන නමුත් මාළිගාවෙන් ලබාදෙන නැකැත්වලට අනුව පෙරහැර කටයුතු කරනු ලබයි. මෙම දේවාලයේ ද ඇතුළේ පෙරහැර පහක්, කුඹල් පෙරහැර පහක්, රන්දෝලි පෙරහැර පහක් පවත්වා දිය කැපීමේ පෙරහැර ද සිදු කෙරේ. දේවාලේ ඇතුළේ පෙරහැරේ දී විශේෂ දේව ආයුධයක් සරසා පිරිත්ගේ හෙවත් දේවාලේ දිග්ගේට ඇතුළතින් වැඩ සිටින මාළිගයට පිටින් වූ පිරිත් ගෙයි සිටුවා ඇති කප දක්වා වැඩමවන රන් ආයුධය කප පැදකුණු කර ආපහු දේවාලයේ ආසනයට ගෙනවිත් තැන්පත් කරයි. එසේ දින පහක් පෙරහැර කිරීමෙන් පසු ආරම්භ වන්නේ කුඹල් පෙරහැරයි. මෙම දේවාලයේ පෙරහැර ගමන් ගන්නා අවසානය හෙවත් දිග්ගේ පිහිටා ඇත්තේ දේවාලයට සමීපව ය. කුඹල් පෙරහැර දෙවියන් වැඩම කරවීම සඳහා හස්තියකු යොදාගෙන චාම් අයුරින් පවත්වයි. ඉන් අනතුරුව පුරා දින පහක් උත්කර්ෂවත් අයුරින් රන්දෝලි පෙරහැර පැවැත්වේ. මෙම පෙරහැර නැරඹීම සඳහා විශාල බැතිමත්තු පිරිසක් සහභාගී වෙති. පෙරහැරේ ස්වභාවය තීරණය වන්නේ දේවාලයේ භාරකාරත්වය දරන බස්නායකවරයාගේ උනන්දුව හා උත්සාහය මත ය.

පෙරහැර මංගල්‍යය අවසාන වන්නේ දිය කැපීමේ චාරිත්‍රයත් සමඟ ය. මෙම දේවාලයෙහි දිය කැපීමේ චාරිත්‍රය සඳහා ඉරිදා දිනය යොදා ගනු ලැබේ. ඒ සඳහා බලපාන කරුණු කිහිපයක් ඒ.එම්. ටිකිරිබණ්ඩා කපුමහතා විසින් පෙන්වා දෙන ලදී. 1915 ගම්පොල සිදුවූ සිංහල-මුසලිම් කෝලාහලය නිසා පෙරහැර අවසන් දිනය සිකුරාදා දිනයක් වුවහොත් යම් ගැටලුකාරී තත්ත්වයක් උද්ගත විය හැකි වීම නිසා හෝ දිය කැපුමට යොදාගන්නා බෝතලාපිටිය රේල් පාර සමීපයේ පිහිටා තිබීම නිසා ය. එවකට නිතර රේල් බස් ධාවනය පැවති බැවින් යම් හෙයකින් අලින් කුලප්පු විය හැකි බවට විශ්වාසයක් සමාජයෙහි ගොඩනැගී තිබුණි. ඉරිදා දිනයේ මෙම සේවාව අඩු වූ බැවින් එකී දිනය යොදාගත් බවට පවතින තවත් මතයක් පවතී.

කෙසේ නමුත් මෙම දේවාලය පමණක් දිය කැපුම් චාරිත්‍රය සිදු කරන්නේ නොමැත. ගඩලාදෙණිය, ලංකාතිලක, ඇම්බැක්ක, වල්ලාහාගොඩ හා වේගිරිය යන දේවාල එක ම දිනයකදී මෙම චාරිත්‍රය ඉටු කරයි**(තුන්දෙණිය,2002,97).** ඒ සඳහා ඉවහල් වූ අතීත කථාවක් පවතී. එනම් ගම්පොල යුගයේ වඩාත් ප්‍රසිද්ධියට පත් වූ හෙනකඳ බිසෝ

බන්ඩාර දේවිය ඇම්බැක්ක දේවාලය ඉදිකිරීමට දායක වූ බවට ද විශ්වාසයක් පවතී. කාලයාගේ ඇවෑමෙන් ඇය මිය ගිය පසු කහට කොටයක දමා ගඟේ පාකර එවයි. එසේ පාවී ආ කහට කොටය කහටපිටිය පල්ලිය අසල නතර වේ.

"හෙනකඳ බිසෝබන්ඩාර දෙවි ගඟේ පාවෙනවා
පාවෙමින් ම ගඟසිරිපුර අසල වටිනවා
පාවී ආපු කහටකොටය වැල්ලේ හැපෙනවා
එදා පටන් කහටපිටය නම පවතිනවා"**(2013-07-08 සාකච්ඡාව)**

දේහය තබා එවන ලද කහට කොටය අද ද කහටපිටිය පල්ලියේ තැන්පත් කර ඇත. හෙනකඳ බිසෝබන්ඩාරගේ මිනිය ගසා ගෙන ආ පුවත උනම්බුවේ නම් පිරිස විසින් ඇම්බැක්කට ගොස් දන්වන ලබයි. පසුව එම දේහය රැගෙනවිත් දින පහක් තිස්සේ මිහිදන් කළත් මතුව තිබේ**(උඩුනුවර ප්‍රදේශයේ පවතින ජනප්‍රවාද ඇසුරෙනි).** මෙම සිද්ධිය පාදක කරගනිමින් ඉහතින් සඳහන් කළ දේවාල පහ එක ම දිනයෙක දිය කැපීමේ චාරිත්‍රයක් පවත්වයි. මෙම දේවාල පහේ දිය කැපීමේ චාරිත්‍රයේ අන්තර්ගත වන විශේෂ ලක්ෂණයක් ඇත. එනම් අදාළ ස්ථානයට ගමන් හේවිසියෙන් ගොස් චාරිත්‍රානුකූලව දිය කපා අවසන් වූ විට ප්‍රධාන කපු මහත්වරු යම් විධානයක් බෙරකරුවන් හට ලබා දෙති. එතැන් පටන් පෙරහැර ගෙවදින තෙක් පැමිණෙන්නේ මළබෙර වයමිනි. ඉන් අදහස් වන්නේ හෙනකඳ බිසෝබණ්ඩාර දේවිය දින පහක් ආදාහනය කිරීමේ චාරිත්‍රයයි. කෙසේ නමුත් වේගිරිය නාථ දේවාලයේ වැඩ සිටින තාරා ප්‍රතිමාව තුළින් ද නිරූපණය වන්නේ හෙනකඳ බිසෝබණ්ඩාර බවට මෙම පළාතේ වැසියෝ විශ්වාස කරති**(තුන්දෙණිය,මහනුවර විහාර වංශය).** තවද මෙම දේවාලයේ සුවිශේෂී බවක් ඇත. එනම් මෙහි පත්තිනි දේවාලයක් ද තිබේ. ඉන් අදහස් වන්නේ නාථ දෙවියන්ගේ ආරක්ෂාව සඳහා පත්තිනි දෙවියන් වැඩ සිටින බවයි. නාථ දෙවියන් සමීපයේ තම බිරිඳගේ ප්‍රතිමාව නෙළා ඇති එක ම දේවාලය වන්නේ වේගිරිය නාථ දේවාලය පමණි.

නාථ දේව වන්දනයේ ප්‍රභවය පිළිබඳ පරීක්ෂා කිරීමේදී මෙරට බෝධිසත්ත්ව සංකල්පය හා මහායාන බුදු සමය ඇසුරෙන් ඉදිරියට පැමිණ ඇත. මහායාන අදහස් සහ හින්දු ආගමේ බලපෑම නිසා දේව වන්දනය ද වර්ධනය විය. උඩරට ප්‍රදේශයේ නාථ දේව වන්දයේ ව්‍යාප්තවීමේ ප්‍රතිඵලයක් වන්නේ වේගිරිය නාථ දේවාලය සඳහන් කළ හැකි ය. ගම්පොල යුගයට අයත් මෙහි සුවිශේෂී ගෘහනිර්මාණ ලක්ෂණ රැසක් ඇත. අතීතයේ සිට අද දක්වා පවත්වාගෙන එන පූජා චාරිත්‍ර ඉතාවැදගත් වේ. වේගිරිය දේවාලේ මූලික

කටයුතු අතර දෛනික තේවාව ඉතා වැදගත් විය. ඒ සඳහා පුහුණු වූ තේවාකරුවෝ අත්‍යවශ්‍ය වෙති. එම ශ්‍රමය ලබාගන්නේ සිය ප්‍රභූ පරපුරින් පත්වූ ඇතුළ් කට්ටලේ නිලකාරයන්ගෙනි. පිට කට්ටලේ නිලකාරයන් අවශ්‍ය වූයේ දේවාලයේ වාර්ෂික මංගල්‍යවලදී හා දේවාලය සතු සම්පත් ආරක්ෂා කර පවත්වාගෙන යාම පිණිසය. වේගිරිය නාථ දේවාලවල ප්‍රධාන රාජකාරී ඉටුකරනු ලබන්නේ සාම්ප්‍රදායික ව රාජකාරි ඉටු කර ගෙන ආ කපු පරපුර විසිනි. මෙම දේවාලය ඇසුරෙන් පැවැත්වෙන වාර්ෂික සතර මංගල්‍යය වන කාර්තික, අලුත් සහල්, අලුත් අවුරුදු සහ පෙරහැර යනාදි මංගල්‍යයන් විශේෂ වේ. මංගල්‍යය ඉටු කිරීමට අවශ්‍ය ශුභ නැකැත් සකසා දෙනු ලබන්නේ දළදා මාළිගාවෙනි. සියලු ම දේවාල එම නියෝගයට යටත්ව කටයුතු කරයි. සාම්ප්‍රදායික ව රාජකාරී කිරීමේ දී අවශ්‍ය සහල් යනාදිය ලබාගැනීමට දළදා මාළිගාවේ වී අටුව ඇති ගුරුදෙණියට ගියත් අද යන්නේ පල්ලේකැලේට ය. ගුරුදෙණිය කුඹුරේ සහල් දළදා මාළිගාවේ මුළුතැන් පූජාවට භාවිතා කරයි. එහෙත් නූතන සංකීර්ණ සමාජ ක්‍රමය තුළ මෙවෙනි දේවාල විධිමත්ව පවත්වාගෙන යෑම අසීරු ක්‍රියාවකි.

---

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අමරසේකර, දයා, (2007). **පත්තිනි දෙවියෝ යාතු කර්ම සහ පුද පූජා,** ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල.

ගයිගර්, විල්හෙල්ම්, **(1946). මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය,** පරි. එච්.බී. ආරියපාල, ගුණසේන සහ සමාගම,කොළඹ.

ධර්මදාස, කේ.එන්.ඕ. සහ තුන්දෙණිය එච්.එම්.එස්.(1994). **සිංහල දේව පුරාණය,** මුද්‍රණ නිතීගත සංස්ථාව, පාදුක්ක.

වාචිස්වර, කොටගම, (1960). **සරණංකර සංඝරාජ සමය**, විසිඳුන ප්‍රකාශන, කොළඹ.

සුනිල්, ඕ. (2001). **දැඩිමුණ්ඩ දෙවියෝ,** කතෘ ප්‍රකාශන.

සෝමානන්ද,අම්බුලුවාවේ.(1972). "වේගිරිය නාථ දේවාලය" **සාහිත්‍යය,** සංස්. විනි විතාරණ සහ කේ.ජී. අමරදාස සහ වෙනත් අය. සංස්කෘතික දෙපාර්තමේන්තුව.

තුන්දෙණිය එච්.එම්.එස්. **මහනුවර විහාර වංශය,** (අත් පිටපත) පුස්තකාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

තුන්දෙණිය, එච්.එම්.එස්. (2002). **ගම්පොල යුගයේ දේශපාලන ක්‍රියාකාරිත්වය,** තරංජි ප්‍රින්ට්ස්, මහරගම.

පියනන්ද,අටබාගේ, (1997). **ලක්දිව බුද්ධ ප්‍රතිමාවේ ලක්ෂණ,** මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

පීරිස්,රල්ප්, (1963).**සිංහල සමාජ සංවිධානය** (මහනුවර යුගය), සීමාසහිත සමන් ප්‍රකාශකයෝ, කොළඹ.

හෝල්ට්, ජෝන්, ක්ලිෆර්ඩ්, (1994).**මකුට මුනිධාරි අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය,** පරි.පී.බී.මීගස්කුඹුර, ප්‍රදීප ප්‍රකාශන, කොළඹ.

**ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය,** (1952).සංස්. වැලිවිටියේ සෝරත, ලංකාණ්ඩු මුද්‍රණාලය, කොළඹ.

වේගිරිය නාථ දේවාලයේ කපු කටයුතු භාර ඒ.එම්. ටිකිරිබණ්ඩා සමඟ 2013-07-08 දින පැවැති සාකච්ඡාව ඇසුරෙන් ලබාගත් තොරතුරු.

Knox, Roberts, (1984). **An Historical Relation of the Island of Ceylon**, Hangar Publisher, New Delhi.

Mudiyanse, N. (1976). **Mahayana Monuments in Ceylon**, Gunasiri, Colombo.

Senevirathna, , H.L. **(1978).** ***Rituals of Kandyan State***, Cambridge University Press.